## බළන්ගොඩ නගර සභා රැස්වීම් වාර්තාව

ස්ථානය : බළන්ගොඩ නගර සභා රැස්වීම් ශාලාව.

දිනය : 2010.07.29

වේලාව : පෙ.ව.10.00

බළන්ගොඩ නගර සභාවේ ගරු සභාපති, ඩබ්.එම්.එන්.ජී.වීරසිංහ මැතිතුමාගේ ප්‍රධානත්වයෙන් සභාවේ කටයුතු පවත්වන ලදී.

**සහභාගීත්වයඃ-**

| | |
|---|---|
| 01. ගරු සභාපති, | ඩබ්.එම්.එන්.ජී.වීරසිංහ මැතිතුමා |
| 02. ගරු නාගරික මන්ත්‍රී | ඊ.ඒ.ජේ.ප්‍රේමකුමාර මැතිතුමා |
| 03. ගරු නාගරික මන්ත්‍රී | ඩබ්.ඒ.වසන්ත පුෂ්පකුමාර ගුණරත්න මැතිතුමා |
| 03. ගරු නාගරික මන්ත්‍රී | ධර්මසේන සමරසිංහ මැතිතුමා. |
| 04. ගරු නාගරික මන්ත්‍රී | එම්.ටී.එම්. රූමි මැතිතුමා |
| 05. ගරු නාගරික මන්ත්‍රී | එම්. නිමල් කරුණාරත්න මැතිතුමා |
| 06. ගරු නාගරික මන්ත්‍රී | යූ.එච්. ගාමිණී මැතිතුමා |

**සහභාගීනොවූවෝඃ-**

| | |
|---|---|
| 01. ගරු උපසභාපති | සුමේද චාමින්ද බස්නායක මැතිතුමා |
| 02. ගරු නාගරික මන්ත්‍රී | ඩබ්.විමලසේන මැතිතුමා |

**නිලධාරී සහභාගීත්වයඃ-**

| | |
|---|---|
| 01. ආර්.ඩී.නලින් පුෂ්පකුමාර | ලේකම් |

(01) **ආගම සිහිකිරිමඃ**

රැස්වීමට පැමිණ සිටි සියළු දෙනා තම තමන්ගේ ආගම සිහිකිරීමෙන් අනතුරුව රැස්වීමේ කටයුතු ආරම්භ කරන ලදි.

(02) **ගරු සභාපතිතුමා විසින් කරනු ලබන නිවේදනඃ**

ගරු සභාපතිතුමා කථාකරමින්, අද දින පවත්වනු ලබන්නේ 2010 වර්ෂයේ ජුලි මාසයට අදාළ මහා සභා රැස්වීම වන අතර , ඒ සඳහා සහභාගීවීමට පැමිණ සිටින ගරු මන්ත්‍රීතුමන්ලා ලේකම් මහතා සහ පුවත්පත්කලාවේදී මහතා සාදරයෙන් පිළිගන්නා බව පැවසීය.

බළන්ගොඩ නගර සභාව දිවයිනේ අනෙකුත් පළාත් පාලන ආයතන අතරින් ආදර්ශමත් පළාත් පාලන ආයතනයක් ලෙස ප්‍රසිද්ධියට පත්ව ඇති අතර එය තවදුරටත් තහවුරු කරමින් 2008 වර්ෂය සදහා පළාත් පාලන ආයතන අතර පැවති කාර්ය සාධන තරඟයේ දී ජාතික මට්ටමින් තුන්වන ස්ථානයත් , 2009 වර්ෂය වෙනුවෙන් පැවති කාර්ය සාධන තරඟයෙන් සබරගමුව පළාතෙන් පළමු ස්ථානයත් ලබාගත් බැව් දැන්වීය. මේ සම්බන්ධව සිය සතුට ප්‍රකාශ කල ගරු සභාපතිතුමා, මෙම ජයග්‍රහනයන් ලබාගැනීමට දායක වූ මෙම නගර සභාවේ ගරු උපසභාපතිතුමා ඇතුළු ගරු මන්ත්‍රීතුමන්ලාත්ටත් ලේකම්තුමා , ඇතුළු කාර්ය මණ්ඩලයේ සියළු දෙනාටත් සිය හෘදයාංගම ස්තුතිය පිරිනමන බව පැවසීය. ජයග්‍රහන ලබාගත් ආයතන හා නිලධාරීන් වෙත ජය සංකේත හා ත්‍යාග ප්‍රධානය කිරීමේ උත්සවය 2010.08.10 වන දින සබරගමුව පළාත් ගරු ප්‍රධාන අමාත්‍ය මහීපාල හේරත් මැතිතුමාගේ ප්‍රධානත්වයෙන් බළන්ගොඩ ගෝඩන් සන්සිටි උත්සව ශාලාවේ දී පැවැත්වීමට සබරගමුව පළාත් පාලන දෙපාර්තමේන්තුව විසින් අවශ්‍ය කටයුතු යොදා ඇති බව සඳහන් කරන ලදී.

පසුගිය වර්ෂවලදී මෙම නගර සභාව ලබාගත් ජයග්‍රහනයන් පිළිබඳව මෙහි දී අදහස් දැක් වූ අතර , දිවයිනේ අනෙකුත් පළාත් පාලන ආයතන හා රාජ්‍ය ආයතන මෙම සභාවේ කටයුතු අධීක්ෂණය කරන ඔවුන්ගේ ආයතන දියුණු කරගැනීමට ක්‍රියාකරන අතර , ඒ සඳහා අවශ්‍ය උපදෙස් හා මගපෙන්වීම නොපසුබටව ලබාදීමට ද සභාව ක්‍රියාකරනු ලබන බැව් දැන්වීය.

පළාත් පාලන සතිය නිමිතිකරගෙන මෙම සභාව වැඩ සටහන් රැසක් ඉතාමත් සාර්ථකව නිමකල බැවින් , ඒ සඳහා සහයෝගය ලබාදුන් සැම දෙනාටම සිය ස්තුතිය පිරිනමන බව දන්වමින් සිය කථාව අවසන් කරන ලදී.

**(03) 2010.06.23 වන දින පැවැති මාසික මහ සභා රැස්වීමේ වාර්තාව සත්‍ය වාර්තාවක් බවට සභා සම්මත කිරීම:**

2010.06.23 වන දින පැවැති මාසික මහ සභා රැස්වීමේ වාර්තාව සත්‍ය වාර්තාවක් බවට ගරු නාගරික මන්ත්‍රී එම්.ටී.එම්.රූමි මැතිතුමා විසින් යෝජනා කරන ලද අතර, එම යෝජනාව ගරු නාගරික මන්ත්‍රී ධර්මසේන සමරසිංහ මැතිතුමා විසින් ස්ථිර කිරීමෙන් වාර්තාව සභා සම්මත විය.

**(04) පසුගිය සභා වාර්තාව සමාලෝචනය කිරීම:**

වාර්තාව සමාලෝචනය කිරීමක් සිදුනොවීය.

**05. සභාවට ලැබී ඇති ලිපි/පෙත්සම්/පැමිණිලි ආදිය ඉදිරිපත් කිරීම:**

**05:01 මාර්ගයක් නිරවුල් කිරීම**

උක්ත කරුණට අදාළව බළන්ගොඩ ප්‍රාදේශීය ලේකම් විසින් එවා ඇති අංක: ඩීඑස්ඩී/2/4/6/11/2010 හා 2010.07.26 දිනැති ලිපිය සභාගත කරන ලදී.

එමගින් කිරිඳිගල ග්‍රාම නිලධාරී වසමේ පිහිටි ළිඳේ කොටසක් වසා අඩි 03 ක් පාරට ලබාගැනීම සම්බන්ධව විරුද්ධත්වයක් නොමැති බව දන්වා තිබුණි.

මේ සම්බන්ධ සාකච්ඡා කල සභාව මෙම ළිඳ දීර්ඝ කාලයක් තිස්සේ ප්‍රදේශයේ ජනතාව ප්‍රයෝජනයට ගත් අතර , මුල් කාලයේ බළන්ගොඩ මූලික රෝහලට ද මෙම ළිඳෙන් ජලය සපයා ඇති බවත් , මෙම ළිඳ වැසීම සිදුකලහොත් , ප්‍රදේශයේ අනෙකුත් ජල උල්පත් ද සිඳීයාමේ අවධානයක් පවතින බැවින් , ජල පෝෂිත රක්ෂිතයක් ලෙස මෙම ළිඳ ආරක්ෂා කරගත යුතු බව ඒකමතිකව තීරණය කරන ලදී.

මෙම ඉඩම රජය සතු ඉඩමක් වන අතර , මුල් කාලයේ එම ස්ථානයෙන් පාරක් වෙන්කර තිබුණු බැවින් , එම මාර්ගය සභාවට පවරාගෙන සංවර්ධන කිරීමටත් මේ සම්බන්ධව ප්‍රාදේශීය ලේකම් , ග්‍රාම නිලධාරී හා ප්‍රදේශයේ ජනතාව සමඟ නැවත ස්ථානීය පරීක්ෂණයක් සිදුකිරීමටත් වැඩිදුරටත් තීරණය විය.

**05:02 බස්නැවතුම්පළ ගොඩනැගිලි සංකීර්ණය තුළ වාර ප්‍රවේශපත් නිකුත් කිරීම සඳහා සුදුසු ස්ථානයක් වෙන්කරගැනීම**

බළන්ගොඩ ඩිපෝව මගින් පාසැල් ශිෂ්‍ය ශිෂ්‍යාවන් සඳහා සහ රැකි රක්ෂාවල නිරත පිරිස් සඳහා මාස්පතා සැලකිය යුතු වාර ප්‍රවේශපත් සංඛ්‍යාවක් නිකුත් කරනු ලබන අතර , ඔවුන්ට වාර ප්‍රවේශපත් ලබාදීම සඳහා සුදුසු ස්ථානයක් වෙන්කර නොමැති බැවින් , ඒ සඳහා බස්නැවතුම්පල ගොඩනැගිල්ල තුළ සුදුසු ස්ථානයක් වෙන්කර දීමට අවැසි පියවර ගන්නා ලෙස ඉල්ලමින් , ශ්‍රී ලංකා ගමනා ගමන මණ්ඩලයේ බළන්ගොඩ ඩිපෝ කළමණාකරු විසින් එවා ඇති අංක: ශ්‍රීලංගම/සබර/බගො/ධා/07/32/2010 හා 2010.06.16 දිනැති ලිපිය සභාගත කරන ලදී.

බළන්ගොඩ ඩිපෝව විසින් බස්නැවතුම්පළ අංක : ඒ 23 දරණ කඩ කාමරය බදුගෙන ඇති අතර , ඒ සඳහා හිඟ මුදල් ගෙවීමට ඇති බැවින් , එම මුදල ගෙවන ලෙසත් , ඉන් පසුව සුදුසු ස්ථානයක් ලබාදීමටත් සභාවේ අනුමැතිය ලබාදෙන ලදී.

05:03 **ජලනල තාක්ෂණය පිළිබඳ දෙදින වැඩමුළුව**

ඉහත සඳහන් කරුණට අදාළව , පේරාදෙණිය විශ්ව විද්‍යාලයේ ඉංජිනේරු පීඨයේ අධ්‍යක්ෂ විසින් එවා ඇති ලිපිය සභාගත කරන ලදී.

ජලනල තාක්ෂණය පිළිබඳ 2010.08.14 සහ 28 යන දෙදින තුළ පාඨාලාවක් පැවැත්වෙන බැවින් , එම වැඩමුළුව සඳහා මෙම සභාවේ කාර්මික නිළධාරින් මහතා රු.4000/- ක මුදලක් ගෙවා සහභාගි කරවන ලෙස එමගින් ඉල්ලා තිබිණ.

මේ සම්බන්ධව සාකච්ඡා කල සභාව , පළාත් පාලන ගරු අමාත්‍යතුමාට අනුමැතියට යටත්ව ,රු.4000/- ක මුදල සභා අරමුදලින් ගෙවා කාර්මික නිලධාරී එම්.කේ.ජේ.නිශ්ශංක මහතා ඉහත සඳහන් වැඩ මුළුව සඳහා සහභාගීකරවීමට සභාවේ අනුමැතිය ලබාදෙන ලදී.

05:04 **නිවසේ ආරක්ෂාව සඳහා ආරක්ෂක යකඩ වැටක් සවිකරගැනීම:**

උක්ත කරුණට අදාළව බළන්ගොඩ , උඩ ඇල්ලෙපොල අංක: 453 දරණ ලිපිනයේ පදිංචි පී.කේ.ටියුඩර් ජයරත්න මහතා විසින් එවා ඇති 2010.04.19 දිනැති ලිපිය සභාවට ඉදිරිපත් කරන ලදී.

බළන්ගොඩ - රත්නපුර ප්‍රධාන මාර්ගයේ ( ශ්‍රී බෝධිමාලාකාරාම පන්සල අසල ) බස් රථයක් හා වෑන් රථයක් ගැටී පාරෙන් ඉවතට ගොස් නිවසේ හැපීම නිසා නිවස සම්පුර්ණයෙන්ම විනාශයට පත්ව ඇත.

මෙම නිවස පිහිටා ඇත්තේ වංගුවක් සහිත ස්ථානයක වන බැවින් , අනතුරු සිදුවීමේ අවධානමක් පවතින නිසා , මාර්ග සංවර්ධනය කිරීමේදී කියැන්නෑම් සමාගම විසින් නිවස පිහිටි ස්ථානය ඉදිරිපස ගල් බැම්මක් සාදනු ලැබු , නමුත් එම ස්ථානයේ කිසිදු ආරක්ෂිත වැටක් සවිකිරීම සිදුනොකරන ලද බැවින් , මේ සම්බන්ධව අවධානය යොමුකර යකඩ වැටක් සවිකිරීමට කටයුතු කරන ලෙස ඉල්ලා තිබිණ.

මාර්ග සංවර්ධන අධිකාරියේ අවධානය යොමුකිරීමට සභාවේ අනුමැතිය ලබාදෙන ලදී.

05:05 **පුහුණු වැඩ මුළුව - 2010 අගෝස්තු මස 05**

ශ්‍රී ලංකා පළාත් පාලන ආයතනයන්ගේ සංසදය විසින් මෙහෙයවීමට නියමිත " **යහ පාලනය හා ධනාත්මක චින්තනය** " පිළිබඳ සේවකයින් දැනුවත් කිරීමේ වැඩ මුළුව 2010.08.05 වන දින පැවැත්වීමට අදහස් කර ඇති බව දන්වමින් , ශ්‍රී ලංකා පළාත් පාලන ආයතනයන්ගේ සංසදයේ ජාතික සම්බන්ධීකාරක හේමන්ති ගුණසේකර මහත්මිය විසින් එවා ඇති 2010.07.08 දිනැති ලිපිය ගරු සභාවේ දැනගැනීම පිණිස සභාගත කරන ලදී.

මෙම වැඩ මුළුව බළන්ගොඩ , කිරිඳිගල ඩයමන් ශාලාවේ දී පැවැත්වීමට කටයුතු සංවිධානය කර ඇති බැවින් , ඒ සඳහා සහභාගීවන ලෙස ගරු මන්ත්‍රීතුමන්ලා වෙත ගරු සභාපතිතුමා විසින් දැනුම් දෙන ලදී.

05:06 **බොබ්කැට් යන්ත්‍රය සේවා කිරීමට ගිවිසුම් අත්සන් කිරීම**

මෙම සභාව සතු බොබ් කැට් යන්ත්‍රය සේවා කිරීමට අදාළව ඩැක්ස් ඉංජිනියරින් ආයතනය විසින් ඉදිරිපත් කර ඇති ලිපියක් සභාගත කරන ලදී.

මේ සම්බන්ධව පසුව සලකා බලා තිරණයක් ගැනීම සුදුසු බවට සභාව අනුමත කරන ලදී.

05:08 **බේරුම්කරණ මධ්‍යස්ථාන නඩුව**

ඉහත අංක දරණ නඩුව 2010.07.26 වන දින කැඳවීමට නියමිත අතර , එදිනට වෘත්තීමය ගාස්තු වශයෙන් රු.30,000/- ක මුදලක් ලැබීමට සලස්වන ලෙස ඉල්ලා , නීතීඥ ඩබ්.දයාරත්න මහතා විසින් එවා ඇති 2010.07.02 ලිපිය සභාගත කරන ලදී.

අදාළ මුදල ගෙවීමට සභාවේ අනුමැතිය ලබාදෙන ලද අතර , ඉදිරි නීතිමය කටයුතු සඳහා ද මෙම නීතීඥ මහතා යොදවා ගැනීමටත් තීරණය කරන ලදී.

## 05:09 ජේ.සී.බී. යන්ත්‍රයේ සේවාව ලබාගැනීම

ඉඹුල්පේ ප්‍රාදේශීය මහා ලේකම් කාර්යාලයේ අළුතින් ඉදිකරන ලද නව රැස්වීම් ශාලාව 2010.07.30 වන ගරු රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු පිළිබඳ ගරු අමාත්‍ය ඩබ්.ඩී.ජේ.සෙනෙවිරත්න මැතිතුමාගේ ප්‍රධානත්වයෙන් විවෘත කිරීමට කටයුතු යොදා ඇති බැවින් , එම උත්සව භූමියේ බිම සකස් කිරීම සඳහා මෙම සභාව සතු ජේ.සී.බී.යන්ත්‍රයේ සේවාව නොමිළයේ ලබාදෙන ලෙස ඉල්ලමින් , ඉඹුල්පේ ප්‍රාදේශීය ලේකම් විසින් එවා ඇති ඉප්‍රා/60/විවිධ/2010 හා 2010.07.23 දිනැති ලිපිය සභාගත කරන ලදී.

රාජ්‍ය ආයතනයක් වන බැවින් ද එම ආයතනය මෙම සභාවේ කටයුතු සඳහා ද සහයෝගය ලබාදෙන බැවින් ද , නොමිළයේ මෙම සේවාව ලබාදීමට සභාවේ අනුමැතිය ලබාදෙන ලදී.

## 05:10 වරිපනම් නිදහස් කිරීම - අංකඃ126 හපුතලේ පාර

උක්ත කරුණට අදාළව ඉදිරිපත් කර ඇති ලිපියක් සභාගත කරන ලදී.

හපුතලේ පාර අංකඃ 126 දරණ ගොඩනැගිල්ල සඳහා 2009.12.31 දිනට හිඟ වරිපනම් රු.10534/- ක මුදලක් අයවීමට ඇත.

මෙම ගොඩනැගිල්ල බණ්ඩාරවෙල ප්‍රදේශයේ අයෙකු විසින් මිළට ගෙන ඇති අතර , ඔහුගේ නම හෝ ලිපිනය සොයා ගැනීමට නොහැකි බවත් , මෙම ගොඩනැගිල්ල දැනට වර්ෂ කිහිපයක සිට වසා දමා ඇති අතර , දිරාපත් වී කඩා වැටීමට ආසන්න බැවින් , මෙම ගොඩනැගිල්ල සඳහා සියළුම හිඟ මුදල් අයකර 2010 වර්ෂයේ සිට වරිපනම් සම්පූර්ණයෙන් නිදහස් කර ඉඩම් කොටස සඳහා පමණක් වරිපනම් අයකිරීම සුදුසු බව දන්වා තිබිණ.

මේ සඳහා සභාවේ අනුමැතිය ලබාදෙන ලදී.

## 05:11 කුමාරගම පිරිවෙන පාර කනත්තට යන මාර්ගය සංවර්ධනය කිරීම

ඉහත සඳහන් කාරණයට අදාළව ඉදිරිපත් කර ඇති 2010.07.29 දිනැති ලිපිය සභාගත කරන ලදී.

බළන්ගොඩ , කුමාරගම පිරිවෙන පාර කනත්තට යන මාර්ගයේ පැති බැම්ම ඉදිකර සංවර්ධනය කිරීම සඳහා ගරු නාගරික මන්ත්‍රී එම්.ටී.එම්.රූමි මැතිතුමා විසින් යෝජනාවක් ඉදිරිපත් කර ඇත.

සංවර්ධනය කිරීමට අපේක්ෂිත මාර්ග කොටස රජයට අයත් බිම් තීරුවක තිබෙන බැවින් , ඒ සඳහා ප්‍රාදේශීය ලේකම් වෙතින් අනුමැතිය ලබාගත යුතු බව දන්වා තිබිණ.

මේ සඳහා ප්‍රාදේශීය ලේකම් වෙතින් අනුමැතිය ලබා ගැනීමට සභාවේ අනුමතිය ලබාදෙන ලදී.

## 05:12 ටෙන්ඩර් මණ්ඩල අනුමැතිය /සභා අනුමැතිය ලබාගැනීම බළන්ගොඩ සතිපොළ ඉදිකිරීම කො.අංකය ඃබනස/ක/03/93/1- 2009.02.10

උක්ත කර්මාන්තයේ වැඩ ඉටුකරගෙන යාමේ දී ගිවිසුම්ගත මුදල ඉක්මවා ඉටු කිරීමට සිදු වූ වැඩ කොටස් වෙනුවෙන් කොන්ත්‍රාත්කරුගේ ගෙවීම් නිරවුල් කරවාදීම පිණිස ටෙන්ඩර් මණ්ඩල අනුමැතිය /සභා අනුමැතිය ලබාගැනීම අවශ්‍ය බව දන්වමින් බළන්ගොඩ විධායක ඉංජිනේරු විසින් එවා ඇති අංකඃ EEB 12/03/11/08 හා 2010.07.14 දිනැති ලිපිය සභාගත කරන ලදී.

අදාළ මුදල් ගෙවීමට සභාවේ අනුමැතිය ලබාදෙන ලදී.

05:13 **ඉඩම් හිමිකම් නිරවුල් කිරීම**

ඉහත සඳහන් කරුණට අදාළව ඉදිරිපත් කර ඇති ලිපියක් සභාගත කරන ලදී.

ඉඩම් හිමිකම් නිරවුල් කිරීමේ දෙපාර්තමේන්තුව විසින් හිමිකම් සහතික ලබාගැනීමේ දී බළන්ගොඩ නගර සභාව සතුව ඇති ඇතැම් ඉඩම් සඳහා විධිමත් හිමිකම් ඔප්පු ඉදිරිපත් කළ නොහැකි තත්ත්වයක් පවති.

නගර සභා ආඥා පනතේ අංකඃ 32 යටතේ ලැබී ඇති බලතල ප්‍රකාරව , පහත සඳහන් ඉඩම් නගර සභාව සතු බවත් , එම සඳහා හිමිකම් සහතිකය නිකුත්කරන ලෙස ඉල්ලීම සුදුසු බව ගරු සභාපතිතුමා විසින් යෝජනා කරන ලදී. එම යෝජනාව ගරු නාගරික මන්ත්‍රී එම්.ටී.එම්.රුමි මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

කැඩැස්තර සිතියම් අංකය - 620076 කලාප අංකය - 01

| කැබලි අංකය | බිම් ප්‍රමාණය(හෙක්ටයාර්) | ඉඩමේ නම | හිමිකම් කියන්නා |
|---|---|---|---|
| 07 | 0.0050 | පඩිපෙළකි | බළන්ගොඩ නගර සභාව |
| 09 | 0.0009 | සිමෙන්ති කාණුවකි | බළන්ගොඩ නගර සභාව |
| 11 | 0.0012 | පඩිපෙළකි | බළන්ගොඩ නගර සභාව |
| 17 | 0.0006 | සිමෙන්ති කාණුවකි | බළන්ගොඩ නගර සභාව |
| 46 | 0.0085 | සිමෙන්ති කාණුවකි | බළන්ගොඩ නගර සභාව |
| 48 | 0.1500 | දෙහිපිටියගේකුඹුර | බළන්ගොඩ නගර සභාව |
| 49 | 0.0039 | සිමෙන්ති කාණුවකි | බළන්ගොඩ නගර සභාව |
| 50 | 0.1083 | දොරවෙලවත්ත,දෙහිපිටියගේකුඹුර, ගල්කැටියෙහේන,බද්දෙලාගෙවත්ත | බළන්ගොඩ නගර සභාව |
| 51 | 0.0011 | සිමෙන්ති කාණුවකි | බළන්ගොඩ නගර සභාව |
| 52 | 0.0739 | දොරවෙලවත්ත,දෙහිපිටියගේකුඹුර, ගල්කැටියෙහේන,බද්දෙලාගෙවත්ත | බළන්ගොඩ නගර සභාව |
| 54 | 1.2383 | දෙහිපිටියගේකුඹුර, ගල්කැටියෙහේන,බද්දෙලාගෙවත්ත | බළන්ගොඩ නගර සභාව |
| 55 | 0.0802 | මාර්ග | බළන්ගොඩ නගර සභාව |
| 56 | 0.0044 | සිමෙන්ති කාණුවකි | බළන්ගොඩ නගර සභාව |
| 57 | 0.0013 | පැරණි දොරවෙල ඔය | බළන්ගොඩ නගර සභාව |
| 58 | 0.0017 | සිමෙන්ති කාණුවකි | බළන්ගොඩ නගර සභාව |
| 59 | 0.3868 | පැරණි දොරවෙල ඔය, ගල්කැටියෙහේන,බද්දෙලාගෙවත්ත | බළන්ගොඩ නගර සභාව |
| 60 | 0.3186 | පැරණි දොරවෙල ඔය, දෙහිපිටියගේකුඹුර, ගල්කැටියෙහේන,බද්දෙලාගෙවත්ත | බළන්ගොඩ නගර සභාව |
| 62 | 0.2072 | දෙහිපිටියගේකුඹුර,ගල්කැටියෙහේන, බද්දෙලාගෙවත්ත | බළන්ගොඩ නගර සභාව |
| 63 | 0.2509 | මාර්ග | බළන්ගොඩ නගර |

| | | | |
|---|---|---|---|
| | | | සභාව |
| 82 | 0.0739 | මාර්ග | බළන්ගොඩ නගර සභාව |
| 114 | 0.2854 | මාර්ග | බළන්ගොඩ නගර සභාව |

කැඩැස්තර සිතියම් අංකය - 620076 කලාප අංකය - 01

| කැබලි අංකය | බිම් ප්‍රමාණය(හෙක්ටයාර්) | ඉඩමේ නම | හිමිකම් කියන්නා |
|---|---|---|---|
| 187 | 0.0127 | මාර්ග | බළන්ගොඩ නගර සභාව |
| 188 | 0.0181 | මාර්ග | බළන්ගොඩ නගර සභාව |

කැඩැස්තර සිතියම් අංකය - 620077 කලාප අංකය - 10

| කැබලි අංකය | බිම් ප්‍රමාණය(හෙක්ටයාර්) | ඉඩමේ නම | හිමිකම් කියන්නා |
|---|---|---|---|
| 6 | 0.0006 | කෝන්ගහකුඹුරවත්ත,කිව්ලෙවෙල | බළන්ගොඩ නගර සභාව |
| 8 | 0.0062 | කෝන්ගහකුඹුරවත්ත,කිව්ලෙවෙල | බළන්ගොඩ නගර සභාව |
| 10 | 0.0155 | කෝන්ගහකුඹුරවත්ත,කිව්ලෙවෙල | බළන්ගොඩ නගර සභාව |
| 12 | 0.0151 | කෝන්ගහකුඹුරවත්ත,කිව්ලෙවෙල | බළන්ගොඩ නගර සභාව |
| 13 | 0.0147 | කෝන්ගහකුඹුරවත්ත,කිව්ලෙවෙල | බළන්ගොඩ නගර සභාව |
| 16 | 0.0171 | කෝන්ගහකුඹුරවත්ත,කිව්ලෙවෙල | බළන්ගොඩ නගර සභාව |
| 20 | 0.0493 | කෝන්ගහකුඹුරවත්ත,කිව්ලෙවෙල | බළන්ගොඩ නගර සභාව |
| 21 | 0.0029 | සිමෙන්ති කාණුවකි | බළන්ගොඩ නගර සභාව |
| 22 | 0.0072 | කෝන්ගහකුඹුරවත්ත,කිව්ලෙවෙල | බළන්ගොඩ නගර සභාව |
| 23 | 0.0106 | කෝන්ගහකුඹුරවත්ත,කිව්ලෙවෙල | බළන්ගොඩ නගර සභාව |
| 24 | 0.0009 | සිමෙන්ති කාණුවකි | බළන්ගොඩ නගර සභාව |
| 25 | 0.0031 | පොදු ළිඳ | බළන්ගොඩ නගර සභාව |
| 26 | 0.0165 | කෝන්ගහකුඹුරවත්ත,කිව්ලෙවෙල | බළන්ගොඩ නගර සභාව |
| 27 | 0.0132 | කෝන්ගහකුඹුරවත්ත,කිව්ලෙවෙල | බළන්ගොඩ නගර සභාව |
| 28 | 0.0124 | කෝන්ගහකුඹුරවත්ත,කිව්ලෙවෙල | බළන්ගොඩ නගර සභාව |
| 29 | 0.0210 | කෝන්ගහකුඹුරවත්ත,කිව්ලෙවෙල | බළන්ගොඩ නගර සභාව |
| 30 | 0.0738 | මාර්ග | බළන්ගොඩ නගර සභාව |

| | | | |
|---|---|---|---|
| 31 | 0.0075 | මාර්ග | බළන්ගොඩ නගර සභාව |
| 38 | 0.0049 | සිමෙන්ති කාණුවකි | බළන්ගොඩ නගර සභාව |
| 39 | 0.0124 | කෝන්ගහකුඹුරවත්ත,කිව්ලෙවෙල | බළන්ගොඩ නගර සභාව |
| 41 | 0.0172 | කෝන්ගහකුඹුරවත්ත,කිව්ලෙවෙල | බළන්ගොඩ නගර සභාව |

කැඩැස්තර සිතියම් අංකය - 620077 කලාප අංකය - 10

| කැබලි අංකය | බිම් ප්‍රමාණය(හෙක්ටයාර්) | ඉඩමේ නම | හිමිකම් කියන්නා |
|---|---|---|---|
| 43 | 0.0132 | කෝන්ගහකුඹුරවත්ත,කිව්ලෙවෙල | බළන්ගොඩ නගර සභාව |
| 44 | 0.0305 | කෝන්ගහකුඹුරවත්ත,කිව්ලෙවෙල | බළන්ගොඩ නගර සභාව |
| 45 | 0.0020 | කෝන්ගහකුඹුරවත්ත,කිව්ලෙවෙල | බළන්ගොඩ නගර සභාව |
| 56 | 0.0042 | කෝන්ගහකුඹුරවත්ත,කිව්ලෙවෙල | බළන්ගොඩ නගර සභාව |
| 57 | 0.0036 | කෝන්ගහකුඹුරවත්ත,කිව්ලෙවෙල | බළන්ගොඩ නගර සභාව |
| 60 | 0.0334 | මාර්ග | බළන්ගොඩ නගර සභාව |
| 63 | 0.0040 | මාර්ග | බළන්ගොඩ නගර සභාව |
| 72 | 0.0136 | මාර්ග | බළන්ගොඩ නගර සභාව |
| 81 | 0.0107 | කෝන්ගහකුඹුරවත්ත,කිව්ලෙවෙල | බළන්ගොඩ නගර සභාව |
| 83 | 0.0094 | කෝන්ගහකුඹුරවත්ත,කිව්ලෙවෙල | බළන්ගොඩ නගර සභාව |
| 86 | 0.0186 | කෝන්ගහකුඹුරවත්ත,කිව්ලෙවෙල | බළන්ගොඩ නගර සභාව |
| 90 | 0.0205 | කෝන්ගහකුඹුරවත්ත,කිව්ලෙවෙල | බළන්ගොඩ නගර සභාව |
| 101 | 0.0282 | කෝන්ගහකුඹුරවත්ත,කිව්ලෙවෙල | බළන්ගොඩ නගර සභාව |
| 103 | 0.0010 | කෝන්ගහකුඹුරවත්ත,කිව්ලෙවෙල | බළන්ගොඩ නගර සභාව |
| 104 | 0.0035 | කෝන්ගහකුඹුරවත්ත,කිව්ලෙවෙල | බළන්ගොඩ නගර සභාව |
| 105 | 0.0021 | කෝන්ගහකුඹුරවත්ත,කිව්ලෙවෙල | බළන්ගොඩ නගර සභාව |
| 106 | 0.0035 | කෝන්ගහකුඹුරවත්ත,කිව්ලෙවෙල | බළන්ගොඩ නගර සභාව |
| 107 | 0.0015 | කිව්ලෙවෙල | බළන්ගොඩ නගර සභාව |
| 108 | 0.0054 | කෝන්ගහකුඹුරවත්ත,කිව්ලෙවෙල | බළන්ගොඩ නගර සභාව |
| 109 | 0.0083 | කෝන්ගහකුඹුරවත්ත,කිව්ලෙවෙල | බළන්ගොඩ නගර සභාව |
| 110 | 0.0023 | කෝන්ගහකුඹුරවත්ත,කිව්ලෙවෙල | බළන්ගොඩ නගර සභාව |

කැඩැස්තර සිතියම් අංකය - 620077 කලාප අංකය - 10

| කැබලි අංකය | බිම් ප්‍රමාණය(හෙක්ටයාර්) | ඉඩමේ නම | හිමිකම් කියන්නා |
|---|---|---|---|
| 151 | 0.0268 | මාර්ග | බළන්ගොඩ නගර සභාව |
| 160 | 0.0027 | සිමෙන්ති කාණුව | බළන්ගොඩ නගර සභාව |
| 165 | 0.0013 | සිමෙන්ති කාණුව | බළන්ගොඩ නගර සභාව |
| 170 | 0.0063 | සිමෙන්ති කාණුව | බළන්ගොඩ නගර සභාව |

මෙම ඉඩම් සියල්ල සභාව සතු බැවින් , ඒ සඳහා හිමිකම් සහතිකය නිකුත් කරන ලෙස ඉඩම් නිරවුල් කිරීමේ කොමසාරිස් වෙතින් ඉල්ලීමක් කිරීමටත් සභාව අනුමත කරන ලදී.

05:14 **ඕළුගන්තොට සුසාන භූමි ගොඩනැගිල්ල අළුත්වැඩියා කිරීම**

ඉහත සඳහන් සුසාන භූමි ගොඩනැගිල්ලේ පේමන්ට් කොන්ක්‍රීට් යොදා සකස් කර ඇති අතර , ඇතුළත සිමෙන්තිය ඉරිතලා තිබූ බැවින් , එම සිමෙන්තිය සම්පූර්ණයෙන් ගලවා ඉවත් කිරීමට සිදු වූ අතර , එම ගලවන ලද කොටස් නැවත සිමෙන්ති දමා සකස් කල යුතු බැවින් , ඒ සඳහා පෙදරේරුවන් හා අවශ්‍ය ද්‍රව්‍ය නොමැති නිසා අදාළ කාර්යය කරගැනීමට නොහැකි ඇති බැවින් ඒ සඳහා අවශ්‍ය ද්‍රව්‍ය සහ පෙදරේරුවන් ලබාදෙන ලෙස ඉල්ලමින් ගරු නාගරික මන්ත්‍රී එම්.නිමල් කරුණාරත්න මැතිතුමා විසින් ඉදිරිපත් කර ඇති 2010.07.19 දිනැති ලිපිය සභාගත කරන ලදී.

පෙදරේරුවන් සඳහා ( වැඩ කරන දිනයන් වෙනුවෙන් ) මුදල් ගෙවීමට සභාවේ අනුමැතිය ලබාදෙන ලදී.

05:15 **ධර්මශාලා මන්දිරයේ කොන්ක්‍රීට් ස්ලැබ් එක සකස් කිරීම**

බළන්ගොඩ ශෛලතලාරාම විහාරස්ථානයේ ධර්මශාලා මන්දිරය ඉදිකිරීමෙ කටයුතු 2010.07.19 වන දින ආරම්භ කිරීමට නියමිත බැවින් , ඒ සඳහා ජල බවුසර් 04 ක් හා ජේ.සී.බී.යන්ත්‍රයේ සේවාව ලබාදෙන ලෙස ඉල්ලමින් , විහාරාධිපති ස්වාමීන්වහන්ස විසින් එවා ඇති 2010.07.15 දිනැති ලිපිය සභාගත කරන ලදී.

ආගමික කටයුත්තක් වන බැවින් , අදාළ සේවාවන් නොමිළයේ සැපයීමට සභාවේ අනුමැතිය ලබාදෙන ලදී.

05:16 **වානේ අල්මාරියක් ලබාගැනීම**

බළන්ගොඩ මහජන පුස්තකාලයේ පුස්තකාලයාධිපතිණිය විසින් භාවිතා කරනු ලබන කාර්යාලීය මේසය හා ලිපිගොනු හා ලේඛන ආදිය පවත්වාගෙන යන වානේ අල්මාරියේ යතුරු සොයා ගැනීමට නොහැකි බැවින් , වානේ අල්මාරියක් ලබාදෙන ලෙස ඉල්ලමින් ඉදිරිපත් කර ඇති ලිපියක් සභාගත කරන ලදී.

දැනට භාවිතා කරනු ලබන අල්මාරිය සඳහා ලොක් එකක් සවිකිරීමට සභාවේ අනුමැතිය ලබාදෙන ලදී.

05:17 **ළමා අංශය පිහිටුවීම**

බළන්ගොඩ නගර සභාවේ මහජන පුස්තකාලය සඳහා ළමා අංශයක් නොමැතිවීම බලවත් අඩුපාඩුවක් බැවින් , එය වළක්වා ගැනීම සඳහා නිදහස් ආයුර්වේද බෙහෙත් ශාලාව පවත්වාගෙන ගිය ගොඩනැගිල්ල ලබාදීමට අපේක්ෂිත වන බැවින් , එහි පහත සඳහන් අඩුපාඩු සකස් කර ඉතා ඉක්මණින් එම ළමා අංශය පිහිටුවීමට අවශ්‍ය පියවර ගැනීම සුදුසු බව දන්වමින් ඉදිරිපත් කර ඇති බනස/පු/05 හා 2010.07.22 දිනැති ලිපිය සභාගත කරන ලදී.

01. මැද බිත්තිය ඉවත්කර තනි ශාලාවක් සකස් කිරීම
02. කරව්කැටිය පාරට මුහුණලා ඇති යකඩ දොරටුව ඉවත්කර ජනෙල් 03 ක් අලුතින් සකස් කිරීම

03. එම ජනෙල් වලට හා පිටුපස කාමරයේ ඇති ජනෙල් වලට කම්බි දැල් ගැසීම,බිත්ති වර්ණ ගැන්වීම.
04. ළමා අංශයට අවශ්‍ය ඩෙක්ස් හා පුටු ලබාගැනීම
05. ළමා අංශයට අවශ්‍ය පොත් ලබාගැනීම

ඇස්තමේන්තුවක් සකස් කර , සෘජු ශ්‍රමයෙන් ඉදිකිරීම් කටයුතු ඉටුකරදීමටත් අවශ්‍ය පොත් හා භාණ්ඩ ලබාදීමටත් සභාවේ අනුමැතිය ලබාදෙන ලදී.

05:18 **වාරිමාර්ග හා ජල සම්පත් කළමණාකරණ අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක බහු කාර්ය ජල සම්පත් සැලසුම් කිරීමේ ජාතික ව්‍යාපෘතිය දිස්ත්‍රික් වැඩ මුළුව - 2010.07.20**

උක්ත කරුණ සම්බන්ධව ප්‍රාදේශීය ලේකම් බළන්ගොඩ විසින් එවා ඇති අංකඃ DSB/P/1/6/12 හා 2010.07.13 දිනැති ලිපියට අනුව බළන්ගොඩ , නගර සභා බල ප්‍රදේශයට අයත් ග්‍රාමීය ජල සම්පාදනය පිළිබඳ පහත සඳහන් තොරතුරු එම වැඩ මුළුව සඳහා ඉදිරිපත් කිරීමට ප්‍රාදේශීය ලේකම් වෙත යවා ඇති අතර , එම ලිපියේ පිටපතක් ගරු සභාවේ දැනගැනීම පිණිස සභාගත කරන ලදී.

| ජල සම්පාදනය කළයුතු ජන ප්‍රදේශය | අපේක්ෂිත ප්‍රතිලාභී නිවාස ගණන |
|---|---|
| මුගුණමලෙ,දොරවෙල,උඩහගම,කිරිදිගල,ඉත්තෑගලහේන | 300 |
| බුලත්ගම,බැංකියවත්ත,සඳුන්ගම,වැලිහරනාව | 500 |
| හුණුකුඹුර,කෝපිවත්ත,රත්ඔිවිට,පූනක්කන්වත්ත | 1000 |
| ඕළුගන්තොට,රයිවත්ත | 100 |
| උඩකන්ද,කරව්කැටිය | 300 |

මීට අමතරව කල්තොට පාර කුමාර අපේක්ෂිත ප්‍රතිලාභීන් 200 ක් ද , බළන්ගොඩ ජාතික පාසල වට රවුම් පාර ප්‍රතිලාභීන් සංඛ්‍යාව 50 ක් ලෙස සංශෝධනය කර නැවත මෙම ලිපිය ඉදිරිපත් කිරීමට සභාවේ අනුමැතිය ලබාදෙනලදී.

05:19 **බස්නැවතුම්පල මගී විවේකාගාරය බදු ලබාගැනීම**

බළන්ගොඩ නව බස්නැවතුම්පළ ඉහල මාළයේ ඇති මගී විවේකාගාරය දැනට භාවිතා නොකරන බැවින් , එම කාමරය සියළු බදු ඇතුළත්ව මසකට රු.7500/-ක මුදලකට යටත්ව බදු ලබාදෙන ලෙසත් , එහි පිවිසුම් දොරටුව සිය වියදමින් සකස් කරගන්නා බවත් දන්වමින් , බස්නැවතුම්පල ඉහල මහල ඩී.13 කඩ කාමරයේ බදුකරු කේ.ජී.අජිත් අබේසුන්දර මහතා විසින් ඉදිරිපත් කර ඇති ලිපියක් සභාගත කරන ලදී.

අංකඃ ඩී 11/ඒ දරණ කඩ කාමරය 2010.08.01 දින සිට කුලී පදනම මත බදුදීමට සභාවේ අනුමැතිය ලබාදෙන ලදී.

05:20 **බස්නැවතුම්පළ වෙළඳ සංකීර්ණයේ සී 51 කඩ කාමරය**

ඉහත සඳහන් කරුණට අදාළව ඉදිරිපත් කර ඇති ලිපියක් සභාගත කරන ලදී.

බස්නැවතුම්පල වෙළඳ සංකීර්ණයේ උඩුමහලේ අංකඃ සී 51 හා 52 දරණ කඩ කාමර නීතීඥ අමල් ප්‍රනාන්දු හා අනෝමා ප්‍රනාන්දු මහත්මිය විසින් පෙර ගෙවීමේ ක්‍රමයට ( කීමණි ) බදු ගෙන ඇති අතර , මෙම කඩ කාමර දෙක කාලයක් වසා තිබූ බැවින් දඩ මුදල් හිලව්කර ඇති අතර ඔවුන් වර්ෂයක පමණ කාලයක් කඩ කුලී ගෙවීම පැහැර හැර ඇත.

මේ සම්බන්ධ විමසීමේ දී ඔවුනට මෙම කඩ කාමර වලින් කිසිදු ආදායමක් නොමැති නිසා , දඩ මුදල් නිදහස් කරදෙන්නේ නම් කඩකුලී හිඟ මුදල එකවර ගෙවන බව ප්‍රකාශ කරන බැවින් මේ සම්බන්ධව සුදුසු තීරණයක් ගත යුතු බව එමගින් දන්වා තිබිණ.

පළාත් පාලන කොමසාරිස්ගෙන් උපදෙස් ලබාගෙන ඒ අනුව කටයුතු කිරීමට සභාවේ අනුමැතිය ලබාදෙන ලදී.

05:21 **තක්සේරු මුදලට කඩ කාමරයක් බදුලබාගැනීම**

බළන්ගොඩ නව බස්නැවතුම්පළේ ඩී 17 දරණ කඩ කාමරය තක්සේරු මුදලට ලබාදෙන ලෙස ඉල්ලා , බළන්ගොඩ , ඇල්ලෙපොල,රන්දොල උයනගම යශානී එරන්දිකා පියදාස මහත්මිය විසින් එවා ඇති 2010.07.05 දිනැති ලිපිය සභාගත කරන ලදී.

පළාත් පාලන කොමසාරිස්ගේ අනුමැතිය ලබාගැනීමෙන් පසුව බදු දීමට සභාවේ අනුමැතිය ලබාදෙන ලදී.

05:22 **බළන්ගොඩ බස්නැවතුම්පළ කඩ කාමර අංකඃ සී 24**

මෙම සභාව විසින් බුද්ධික භානක හටංගල මහතා වෙත බදු දී ඇති ඉහත සඳහන් කඩ කාමරය පවත්වාගෙන යාමේ අපහසුතාව හේතුවෙන් එම කඩ කාමරයේ ව්‍යාපාර කටයුතු කරගෙන යාම සඳහා තමන් වෙත පවරාදීදමට කැමැත්ත ප්‍රකාශ කර ඇති බැවින් ඒ සඳහා අවසර ලබාදෙන ලෙස ඉල්ලමින් , බළන්ගොඩ කුමාරගම , අංකඃ 183 දරණ ලිපිනයේ පදිංචි මර්සුක් ෂහීම් මහතා විසින් ඉදිරිපත් කර ඇති 2010.07.07 දිනැති ලිපිය සභාගත කරන ලදී.

දිවුරුම් ප්‍රකාශයක් මගින් කඩ කාමරයේ බදු අයිතිය පැවරීමටත් , කීමනි මුදලින් 25% ක මුදල හා සියළුම හිඟ කඩකුලී මොහුගෙන් අයකරගැනීමටත් ගරු අමාත්‍යතුමාගේ අනුමැතියට යටත්ව සංශෝධනය කරදීමට සභාවේ අනුමැතිය ලබාදෙන ලදී.

05:23 **මහජන පොළ ඉදිකිරීම :**

ඉහත සඳහන් කර්මාන්තයේ වැඩ කටයුතු අවසන් කර ඇති අතර එය යථා පරිදි භාරගන්නා ලෙස මීට පෙර ද මෙම සභාව වෙත දන්වා එවා ඇති අතර , තවදුරටත් මෙම ගොඩනැගිලි වල සවිකර ඇති විදුලි පංකා සහ අනෙකුත් පකරණ වල ආරක්ෂාව දැරිය නොහැකි බැව් දන්වමින් , සෑම් ඩෑම් කොන්ත්‍රාත් ආයතනයේ කළමනාකරු විසින් එවා ඇති 2010.07.26 දිනැති ලිපිය සභාවට ඉදිරිපත් කරන ලදී.

වැඩ අවසන් බැවින් , භාණ්ඩ ඉන්වෙන්ට්‍රියක් සමඟ භාර ගැනීමට සභාවේ අනුමත ලබාදෙන ලදී.

05:24 **බොබ් කැට් යන්ත්‍රය සඳහා ටයර් ලබාගැනීම**

මෙම සභාව සතු බොබ් කැට් යන්ත්‍රයේ පාවිච්චිය සඳහා යොදා ඇති ටයර් මේවන විට ගෙවී ඇති බැවින් , නැවත අලුතින් 04 ක් යෙදීම අවශ්‍ය බව දන්වමින් ඉදිරිපත් කර ඇති 2010.07.12 දිනැති ලිපිය සභාගත කරන ලදී.

මිළ ගණන් කැඳවා මිළදී ගැනීමට සභාවේ අනුමැතිය ලබාදෙන ලදී.

05:25 **පළාත් පාලන සතිය - 2010**

පළාත් පාලන සතිය - 2010 අධ්‍යාපන පුස්තකාල සංවර්ධන හා ක්‍රීඩා දිනය වෙනුවෙන් මහජන පුස්තකාලය මගින් පැවැත් වු වැඩ සටහන් සඳහා පුස්තකාල සහයිකා අනුලා කහංගම මහත්මිය රු.5000/- ක මුදලක් ලබාදෙන ලද අතර , මෙම මුදලින් පාසල් ශිෂ්‍ය ශිෂ්‍යාවන් වෙනුවෙන් පැවැත් වු චිත්‍ර තරගයේ ජයග්‍රාහකයින්ට හා සහභාගීවුවන්ට ප්‍රදානය කිරීම සඳහා සහතිකපත් මුද්‍රණය කිරීම , දිවා ආහාර සැපයීම ආදිය සඳහා යොදගත් බැවින් , ඇයගේ පෞද්ගලික ලිපිගොනුවට ප්‍රශංසාත්මක ලිපියක් ඇතුළත් කිරීම සුදුසු බව දන්වමින් ඉදිරිපත් කර ඇති 2010.07.20 දිනැති ලිපිය සභාගත කරන ලදී.

මේ සඳහා සභාවේ අනුමැතිය ලබාදෙන ලදී.

05:26 **පාසැල් ගෙවතු වගාවන් සඳහා පොහොර ඉල්ලුම් කිරීම**

උක්ත කරුණට අදාළව ර/බළන්ගොඩ ශාන්ත ඇග්නස් බාළිකා මහා විද්‍යාලයේ විදුහල්පතිණිය විසින් එවා ඇති 2010.07.27 දිනැති ලිපිය සභාවට ඉදිරිපත් කරන ලදී.

පාසල් ගෙවත්ත තුළ විධිමත් සැලැස්මකට අනුව ගෙවතු වගා වැඩ සටහනක් ක්‍රියාත්මක කිරීමට සැලසුම්කර ඇති බැවින් , ඒ සඳහා ලබන පාසල් වාරයේ දී කොම්පෝස්ට් පොහොර ලබාදෙන මෙන් ඉල්ලා තිබිණ.

නොමිළයේ පොහොර ලබාදීම සඳහා සභාවේ අනුමැතිය ලබාදෙන ලදී.

05:27 **පළාත් පාලන ආයතන අතර කාර්ය සාධන ත්‍යාග ප්‍රදානෝත්සවය - 2009**

පළාත් පාලන ආයතන අතර පැවති කාර්ය සාධන තරඟයේ ත්‍යාග ප්‍රදානෝත්සවය 2010.08.10 වන දින බළන්ගොඩ ගෝල්ඩන් සන් සිටි ආයතනයේ දී පැවැත්වීමට නියමිත අතර , ඒ සඳහා අවශ්‍ය සහයෝගයන් ලබාදෙන ලෙස ඉල්ලමින් සබරගමුව පළාත් පාලන කොමසාරිස් විසින් එවා ඇති සීඑල්ජී/4519 හා 2010.07.26 දිනැති ලිපිය සභාගත කරන ලදී.

1. ශාලාවේ ශබ්ද විකාශනය ( FM මයික් 02 ක් සමග )
2. වේදිකාවේ අලංකරණය සඳහා කැරකෙන වරණවත් බල්බ
3. Mike Stand 01
4. පොල් තෙල් පහන සැකසීම
5. සක් හඬ වාදනය

අවශ්‍ය සහයෝගයන් ලබාදීමට සභාවේ අනුමැතිය ලබාදෙන ලදී.

05:28 **සීමා නිර්ණය කමිටු පිළිබඳ දැනුවත් කිරීම**

උක්ත කරුණට අදාළව සබරගමුව පළාත් පාලන කොමසාරිස් විසින් එවා ඇති අංකඃ සීඑල්ජී/01 හා 2010.05.31 දිනැති ලිපිය ගරු සභාවේ දැනගැනීම පිණිස සභාගත කරන ලදී.

රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු අමාත්‍යාංශයේ ලේකම්ගේ අංකඃ HA/ADD/See/17/Del/Com හා 2010.05.11 දිනැති ලිපියට අනුව 2010 වර්ෂය සඳහා ක්‍රියාත්මක සිමා නිර්ණය කමිටුව මගින් නව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ හා ග්‍රාම නිලධාරී වසම් පිහිටුවා සහ ප්‍රතිශෝධනය කිරීම සඳහා යෝජනා කැඳවීමට කටයුතු කරන ලෙස දන්වා ඇති අතර , ඊට අදාළව පුවත්පත් දැන්වීමක් පළකර ඇති බැවින් , ඒ සම්බන්ධව සභාවේ යෝජනා නියමිත දිනට පෙර සීමා නිර්ණය කමිටුවේ ලේකම් වෙත ඉදිරිපත් කර එහි පිටපතක් පළාත් පාලන කොමසාරිස් වෙත යොමු කරන ලෙස එමගින් දන්වා තිබිණ.

ඒ අනුව අවශ්‍යතා ඇත්නම් යොමුකරන ලෙස ගරු මන්ත්‍රීතුමන්ලා හට දන්වන ලදී.

05:29 **මාළු විකිණීම සඳහා අවසරදීම**

බළන්ගොඩ , කල්තොට පාර , ගොරොක්ගහමඩ අංකඃ 130 දරණ ස්ථානයේ ශීත කල මාළු විකිණීම සඳහා අවසර ඉල්ලා ඇති අතර , පහත සඳහන් කොන්දේසි වලට යටත්ව මේ සඳහා අවසර ලබාදීම සුදුසු බව දන්වමින් ඉදිරිපත් කර ඇති ලිපියක් සභාගත කරන ලදී.

01. පොදු වෙළඳපළ සීමාවෙන් පිටත විය යුතුය.
02. ශීත කල මාළු විකිණීමට අවශ්‍ය ශීතාගාර පහසුකම් හා අයිස් සපයා ගන්නා ආකාරය පැහැදිලි කල යුතුය.
03. වෙළඳසැල තීන්ත ගා සිවිලිම සකස් කර ගෙබිම ටයිල් කල යුතුය.
04. බිත්ති අඩි 06 ක් උසට පිගන් ගඩොල් ඇල්ලිය යුතුය.
05. මාළු සේදීමෙන් හා අයිස් දියවීමේ ජලය යැවීම සඳහා පූතික ටැංකියක් ඉදිකල යුතුය
06. සියළුම ලී බඩු උපකරණ ඇලුමිනියම් ෂීට් යොදා සකස් කල යුතුය.

ඉහත සඳහන් කොන්දේසි වලට යටත්ව ශීතකල මාළු පැකට්කර විකිණීම සඳහා අවසර ලබාදීමට සභාවේ අනුමැතිය ලබාදෙන ලදී.

05:30 **පුස්තකාල සාමාජිකත්වය ලබාදීම - නගර සභා බල ප්‍රදේශයෙන් පිටත පදිංචිකරුවන් සඳහා**

ඉහත සඳහන් කරුණට අදාළව ඉදිරිපත් කර ඇති 2010.07.28 දිනැති ලිපිය සභාගත කරන ලදී.

එමගින් පහත සඳහන් කරුණු කෙරෙහි අවධානය යොමුකර නගර සභා බලප්‍රදේශයෙන් පිටත පදිංචිකරුවන් සදහා පුස්තකාල සාමාජිකත්වය ලබාදීම සුදුසු යැයි දන්වා තිබිණ.

01. පුස්තකාලයේ පොත් බැහැර දෙන අංශයෙ සාමාජිකත්වය ලබාදීමේ දී පුස්තකාල අතුරු ව්‍යවස්ථාවන්ට අනුව නාගරික බලප්‍රදේශය තුළ ස්ථිර පදිංචිකරුවන්ට , නාගරික බලප්‍රදෙශය තුළ පාසලක ඉගෙනුම ලබන ශිෂ්‍යයකුට හෝ ශිෂ්‍යාවියකට , එසේ නැතිනම් , බලප්‍රදේශය තුළ රැකියාව කරන්නකුට පුස්තකාල සාමාජිකත්වය ලබාගත හැක.

02. බැහැර දෙන අංශයේ සාමාජිකත්වය ලබාගැනීම තුළින් ඔහුට හෝ ඇයට පුස්තකාල පොත් බැහැර ගෙන ගිය හැකිය. (නාගරික බලප්‍රදේශයෙන් පිටත පදිංචිකරුවන් පුස්තකාලයෙන් පොත් බැහැර දෙන අංශයේ සාමාජිකත්වය ලබාගැනීමට ඉල්ලුම් කරන අවස්ථා ද ඇත. )

03. නාගරික බලප්‍රදේශයෙන් පිට කි.මී.05 ක් තුළ ස්ථිර පදිංචිකරුවන්ට ද සාමාජිකත්වය ලබාදීම සුදුසුය.

04. මෙම අයදුම්කරුවන් ඔවුන් ස්ථිර පදිංචි ප්‍රදේශයේ ග්‍රාම නිලධාරි මහතා මගින් ඔවුන්ගේ පදිංචිය සනාථ කරවා ගත යුතුය.

05. නාගරික බලප්‍රදේශය තුළ ස්ථිර පදිංචි ලක්ෂ 05 කට නොඅඩු දේපළක් හිමි ස්ථිර පදිංචිකරුවෙකු ඇපකරුවකු වශයෙන් අත්සන් කිරීම අනිවාර්යය බවද මීට අමතරව ඇප මුදල වශයෙන් අයකරනු ලබන රු.116/- ට අමතරව තැන්පත් මුදලක් වශයෙන් රු.1000/- ක මුදලක් සභාවේ තැන්පත් කල යුතු බවද , එම මුදල ආපසු නොගෙවනු ලබන මුදලක් ලෙස අයකල යුතුය.

06. අලාභහානි කිරීම් හෝ නැතිකරනු ලබන විට පොතේ වටිනාකමෙන් දෙගුණයක් අයකිරීම.

මෙම කොන්දේසි වලට යටත්ව නගර සභා බලප්‍රදේශයෙන් පිටත පදිංචිකරුවන් සඳහා පුස්තකාල සාමාජිකත්වය ලබාදීම සඳහා සභාවේ අනුමැතිය ලබාදෙන ලදී.

05:32 **සේවා ගිවිසුම් අත්සන් කිරීම**

මෙම නගර සභා කාර්යාලයේ තිබෙන පැරණි ෆොටෝ කොපි යන්ත්‍රය සේවා කිරීම පිණිස 2010.07.01 දින සිට 2011.06.30 දක්වා වර්ෂයක කාලයක් සඳහා රු.14000/- ක මුදලක් ගෙවිය යුතු බැවින් , මෙම මුදල ගෙවා සේවා ගිවිසුමක් අත්සන් කිරීම සුදුසු බව දන්වමින් ඉදිරිපත් කර ඇති ලිපියක් සභාගත කරන ලදී.

මේ සඳහා සභාවේ අනුමැතිය ලබාදෙන ලදී.

05:33 **නිවාඩු අනුමත කිරීම**

මෙම නගර සභාවේ ගරු උපසභාපති සුමේද චමින්ද බස්නායක මැතිතුමා අසනීප වී නේවාසිකව ප්‍රතිකාර ලබාගන්නා බැවින් අද දින පැවැත්වෙන මාසික මහා සභා රැස්වීමට සහභාගීවිය නොහැකි බව දන්වමින් එවා ඇති 2010.07.28 දිනැති ලිපිය සභාගත කරන ලදී.

නිවාඩු අනුමත කිරීමට සභාවේ අනුමැතිය ලබාදෙන ලදී.

## 05:34 නිවාඩු අනුමත කිරීම

ගරු නාගරික මන්ත්‍රී ඩබ්.විමලසේන මැතිතුමා අසනීපයෙන් පසුවන බැවින් අද දින පැවැත්වෙන මහා සභා රැස්වීමට සහභාගීවිය නොහැකි බව දුරකථනයෙන් දැණුම් දී ඇති බව ගරු සභාපතිතුමා විසින් සභාව වෙත දැණුම් දෙන ලදී.

නිවාඩු අනුමත කිරීමට සභාවේ අනුමැතිය ලබාදෙන ලදී.

## 05:35 හිඟ ජල බිල්පත් නොගෙවීම - පොදු වෙළඳසැල කඩ කාමර

ඉහත සඳහන් කරුණට අදාළව ඉදිරිපත් කර ඇති ලිපියක් සභාගත කරන ලදී.

බළන්ගොඩ නගර සභාව නමින් පොදුවෙළඳසැල කඩ කාමර සඳහා ජලය ලබාගෙන ඇති අතර , පහත සඳහන් කඩ කාමර සඳහා හිඟ ජල බිල්පත් ගෙවීමට ඇත. මෙම හිඟ බිල්පත් නොගෙවුවහොත් සභාවට විරුද්ධව නඩු පැවරීමට කටයුතු කරන බව ජාතික ජල සම්පාදන මණ්ඩලය විසින් දන්වා ඇත.

| | | |
|---|---|---|
| 33-14 කඩය | - | 3067.50 |
| 33-11 කඩය | - | 7042.50 |
| 33-10 | - | 26985.00 |

බදු ගිවිසුම ප්‍රකාරව කඩ හිමියන් ජල බිල්පත් ගාස්තු ගෙවිය යුතුය. එහෙත් ඔවුන් එම මුදල් නොගෙවා ඇති බැවින් ගැටළු සහගත තත්ත්වයක් උදා වී ඇත. එය නිරාකරණය කිරීම සම්බන්ධව තීරණයක් ගැනීම සුදුසු බව දන්වා තිබිණ.

හිඟ බිල්පත් පියවා ගැටළුව නිරාකරණය කිරීමටත් , කඩ හිමියන් කැඳවා මේ සම්බන්ධන සාකච්ඡා කිරීමටත් සභාවේ අනුමැතිය ලබාදෙන ලදී. ජලනල එලීම සඳහා මාර්ගය පළුදු කිරීම වෙනුවෙන් ජාතික ජල සම්පාදන මණ්ඩලය විසින් මෙම සභාවට ගෙවිය යුතු මුදල් කඩිනමින් ගෙවන ලෙස දැණුම්දීමටත් තීරණය කරන ලදී.

## 05:36 බුලත්ගම ශ්‍රී සුනන්දාරාම විහාරස්ථානයේ බහුකාර්ය දෙමහල් ගොඩනැගිල්ල ඉදිකිරීම

ඉහත සඳහන් විහාරස්ථානයේ බහු කාර්ය ගොඩනැගිල්ලේ දෙවන අදියරේ ඉදිකිරීම් කටයුතු ආරම්භ කිරීම සඳහා අවශ්‍ය ද්‍රව්‍යයන් ලබාදීමට දායකත්වය ලබාදෙන ලෙස ඉල්ලමින් එම විහාරස්ථානයේ විහාරාධිපති ස්වාමීන්වහන්ස විසින් එවා ඇති 2010.07.27 දිනැති ලිපිය සභාගත කරන ලදී.

ආගමික කාර්යයක් වන බැවින් , පොදු අරමුදලෙන් රු.5000/- ක මුදලක් ලබාදීම සුදුසු බව ගරු නාගරික මන්ත්‍රී ඩබ්.ඒ.වසන්ත පුෂ්පකුමාර ගුණරත්න මැතිතුමා යෝජනා කරන ලදී. එය ගරු නාගරික මන්ත්‍රී ඊ.ඒ.ජයන්ත ප්‍රේමකුමාර මැතිතුමා විසින් ස්ථිර කරන ලදී. ඒ අනුව මේ සදහා සභාවේ අනුමැතිය ලබාදෙන ලදී.

## 05:37 ජල ණය

ඉහත කරුණට අදාළව බළන්ගොඩ මහජන බැංකුවේ කළමනාකරු විසින් එවා ඇති අංකඃ කළ/ණය/ව/ස. හා 2010.06.02 දිනැති ලිපිය සභාගත කරන ලදී.

ජල ණය පහසුකම් ලබාගත් ණයකරුවන් 33 දෙනාගෙන් 06 දෙනෙකු පමණක් අදාල ණය මුදල් සම්පූර්ණයෙන් ගෙවා අවසන් කර ඇති අතර , ඉතිරි 27 දෙනාගෙන් ද ණය මුදල් අයකර ගැනීමට අවශ්‍ය සහයෝගය ලබාදෙන ලෙස එමගින් ඉල්ලා තිබිණ.

අදාළ ණය මුදල ගෙවන ලෙසත් , එසේ නොකරන්නේ නම්, නීතිමය පියවර ගන්නා බව දන්වමින් නිවේදනයන් නිකුත් කිරීමටත් සභාවේ අනුමැතිය ලබාදෙන ලදී.

05:38 **පුස්තකාල සාමාජිකත්වය ලබාදීම**

බළන්ගොඩ නගර සභා මහජන පුස්තකලයේ පුස්තකාල සාමාජිකත්වය ලබාගැනීමෙ දී පහත සඳහන් කොන්දේසි වලට යටත්ව සමාජිකත්වය ලබාදීම සුදුසු බව දන්වමින් ඉදිරිපත් කර ඇති ලිපියක් සභාගත කරනලදී.

01. අවුරුදු 14 ට අඩු ළමා සාමාජිකත්වය සඳහා රු.58/- ක මුදලක් අයකිරීම.
02. අවුරුදු 14 ට වැඩි සාමාජිකයන් සඳහා වැඩිහිටි සාමාජිකත්වය ලබාදීම සඳහා රු.116/- ක මුදලක් අයකිරීම.

03. නාගරික බලප්‍රදේශය තුල ස්ථිර පදිංචි ළමා සාමාජිකයින්ට විදුහල්පතිගේ නිර්දේශයෙන් තොරව ළමා සාමාජිකත්වය ලබාදීමටත් , ඒ සඳහා රු.58/- ක මුදලක් අයකිරීම.

අදාළ කොන්දේසි වලට යටත්ව සාමාජිකත්වය ප්‍රදානය කිරීමට සභාවේ අනුමැතිය ලබාදෙන ලදී.

05:39 **බළන්ගොඩ මහජන පුස්තකාලයේ පොත් අස්ථානගතවීම**

ඉහත සඳහන් කරුණට අදාළව ඉදිරිපත් කර ඇති ප්‍රධාන අමාත්‍යාංශ ලේකම්ගේ අංකඃ සීඑම්/ඒ/ඩී/18/18 හා 2010.07.19 දිනැති ලිපිය සභාගත කරන ලදී.

2008 වර්ෂය තුළ සිදුකරන ලද භාණ්ඩ සමීක්ෂණයේ දී බළන්ගොඩ මහජන පුස්තකාලයේ පොත් 2296 ක් අස්ථානගතව ඇති බව තහවුරු වී ඇත. එම පොත් වල වටිනාකම 185761.35 ක් වන බැවින්, එම මුදල අයකරගත නොහැකි මුදලක් ලෙස කපා හැරීමට අනුමැතිය ඉල්ලා සිටිය ද මෙවැනි විශාල මුදලක් කපා හැරිය නොහැකි බැවින් මේ සම්බන්ධව වගකිවයුතු වෙනත් නිලධාරීන් හෝ සේවකයින් සිටිද යන්න එම ලිපියෙන් විමසා ඇත.

නමුත් 2009 වාර්ෂික භාණ්ඩ සමීක්ෂයේ දී රු.28723.75 ක් වටිනා පොත් 332 ක් නැවත සොයා ගෙන ඇත. එය අඩුකිරීමෙන් පසුව අස්ථානගත වු පොත් වෙනුවෙන් රු. 157037.60 ක මුදලක් අයකරගත යුතුව ඇත.

පුස්තකාලයාධිපතිව සිට විශ්‍රාම ගිය එච්.ඩී.රුවන් ප්‍රේමසිංහ මහතාගේ විශ්‍රාම පාරිතෝෂික මුදලින් රු.118122.46 ක මුදලක් සභාවේ රඳවාගෙන ඇති අතර , ඇප තැන්පත් වශයෙන් රු.9103/- ක් ද ඔහු තැන්පත් කර ඇති බැවින් , එම සියළු මුදල් නැති වු පොත් වෙනුවෙන් හිලව් කල පසු තවත් රු.29812.14 ක මුදලක් අයකරගත යුතුව ඇත.
මේ සඳහා එම කාලය තුළ සේවය කල අනෙක් නිලධාරීන් ද වගකිව යුතු බැවින් , මේ පිළිබඳ පළාත් පාලන කොමසාරිස් විසින් විධිමත් පරීක්ෂණයක් කර මුදල් අයකරන අයවලුන් , අයකරගන්නා මුදල් ප්‍රමාණය හා වාරික සංඛ්‍යාව පිළිබඳව උපදෙස් හා අනුමැතිය ලබාගැනීමට තීරණය විය.

05:40 **සංවර්ධන උපදේශක සභාවක් පිහිටුවීම**

බළන්ගොඩ නගර සභාවේ සංවර්ධන කටයුතු සාර්ථකව ඉටුකිරීම සහ වාර්ෂික සැලසුම් සකස් කිරීම අරමුණු කරගනිමින් සංවර්ධන උපදේශක සභාවක් පත්කල යුතුව ඇති බැවින් , එම උපදේශක කමිටුව සඳහා පහත සඳහන් පුද්ගලයින් පත්කිරීම සුදුසු යැයි දන්වමින් ඉදිරිපත් කර ඇති ලිපියක් සභාගත කරන ලදී.

01. බළන්ගොඩ කලාප අධ්‍යාපන කාර්යාලයේ හිටපු අධ්‍යාපන අධ්‍යක්ෂ ටී.එච්.පුජදාස මහතා
02. දේශිය වෛද්‍යාචාර්ය කවිරාජ් ගුණතිලක මහතා
03. මනෝජ් ආරියරත්න මහතා ( සබරගමුව විශ්ව විද්‍යාලයේ කථිකාචාර්ය )
04. හිටපු ප්‍රාදේශීය ලේකම්, පුෂ්පා අබේකෝන් මහත්මිය.
05. ඩබ්.එම්.ජයවික්‍රම මහතා
06. ඉන්ද්‍රානී වීරසේකර මහත්මිය
07. රංජනී කහපගේ මහත්මිය
08. ( නීතිඥ ) එම්.එම්.රෆීක් මහතා

උපදේශක කමිටු සාමාජිකයින් ලෙස තෝරා පත්කරගත් බැව් දන්වා යැවීමටත් , මීට අමතරව වෙනත් සුදුසු අය සිටී නම් ඔවුන්ගේ නාම ලේඛනයක් ලබාදෙන ලෙස ගරු මන්ත්‍රීතුමන්ලා වෙත ගරු සභාපතිතුමා විසින් දැණුම් දෙන ලදී.

**05:41 බළන්ගොඩ , රත්නපුර පාර අංකඃ 330 දේපළ තක්සේරු ලේඛනයෙන් කපා හැරීම**

බළන්ගොඩ රත්නපුර පාරේ අංකඃ 330 දරණ ඒ.සී.ෂාපියා උම්මා නමින් පවතින උළු සෙවිලි නිවස සහිත ඉඩම එම්.ජේ.එම්.මහුදූන් හාජ්ජියාර් යන අය විසින් මිළට ගෙන කඩ කාමර 03 ක් ඉදිකර ඇති අතර , මෙම කඩ කාමර තුන 330/ඒ , 330/බී , 330/සී වශයෙන් තක්සේරු කර වෙන වෙනම ලේඛනගත කර බදු අයකරන බැවින්, අංකඃ 330 යටතේ ලේඛනගත කර ඇති ( ඒ.සී.ෂාපියා උම්මා ) දේපළ තක්සේරු ලේඛනයෙන් කපා හැරීම සුදුසු බව දන්වමින් ඉදිරිපත් කර ඇති ලිපියක් සභාගත කරන ලදී.

මේ සඳහා සභාවේ අනුමැතිය ලබාදෙන ලදී.

**05:42 බළන්ගොඩ නගරයේ මාළු වෙළඳාම**

දැනට බළන්ගොඩ නගරය තුළ තැනින් තැන පොදු වෙළඳසැලේ මාළු වෙළඳුන් අනවසරයෙන් මාළු අලෙවි කිරීමේ කටයුතු සිදුකරනු ලබන අතර , ඉදිරියේ දී මෙය තහනම් කිරීමට නොහැකි තත්ත්වයක් ඇතිවීමට ඉඩ ඇති බැවින් මේ සම්බන්ධව තීරණයක් ගැනීම සුදුසු බව දන්වමින් ඉදිරිපත් කර ඇති ලිපියක් සභාගත කරන ලදී.

මාර්ගය දෙපස මාළු විකිනීම තහනම් කිරීමටත් , එම නියෝගය නොසලකන අයට එරෙහිව නීත්‍යානුකූල පියවර ගන්නා බවත් , සතිපොළ ඇතුළත පමණක් මාළු විකිණීම සඳහා අවසර ලබාදීමටත් සභාවේ අනුමැතිය ලබාදෙන ලදී.

**05:43 ජනතා සත්කාරක ජංගම සේවය -2010 සැප්තැම්බර් 18 සහ 19**

ඉහත සඳහන් කරුණට අදාළව , ප්‍රාදේශීය ලේකම් බළන්ගොඩ විසින් එවා ඇති අංකඃ ප්‍රාලේබ/ආ/3/ජං.සේ/201 හා 2010.07.26 දිනැති ලිපිය සභාගත කරන ලදී.

රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු අමාත්‍යාංශයේ මෙහෙයවීමෙන් රත්නපුර දිස්ත්‍රික් ලේකම් කාර්යාලය හා සබරගමුව පළාත් සභාව ඒකාබද්ධව පවත්වනු ලබන ඉහත වැඩ සටහන රත්නපුර සීවලී මධ්‍ය මහා විද්‍යාලයේ දී පැවැත්වෙන අතර , මහජනතාවගේ නොවිසඳී ඇති ගැටළු හා ප්‍රශ්ණ එම කාර්යාලයට ලැබෙමින් පවතින අතර , එම ගැටළු අතරින් මෙම ආයතනයට අදාළ පහත සඳහන් ගැටළු හා ප්‍රශ්ණ සඳහා ගෙන ඇති ක්‍රියාමාර්ගය දිස්ත්‍රික් ලේකම් වෙත යොමු කරන ලෙස එමගින් දන්වා තිබිණ.

| යොමු අංකය | ප්‍ර.ලේ. කොට්ඨාශය | ග්‍රා.නි.කො. | නම/ලිපිනය | ගැටළුව කෙටියෙන් | විෂය | යොමුකල ආයතනය | විසඳුම |
|---|---|---|---|---|---|---|---|
| බීඑල්/විවිධ/5 | බළන්ගොඩ | බුලත්ගම | පී.කේ.විජේසිරි ජයලත් මයා,301,බුලත්ගම, බළන්ගොඩ | රාස්සගල පාර බුලත්ගම 4 වන සැතපුම අසල ප්‍රධාන පාර ආසන්නයේ නිවාස 06 ට ජලය ලබාගැනීම | සෞඛ්‍ය | බළන්ගොඩ නගර සභාව | පානීය ජලය ලබැගනීම |
| බීඑල්/විවිධ/ 6 | බලන්ගො ඩ | බුලත්ගම | අබේගුණවර්ධන රමණී අබේගුණවර්ධන,දේවිකා මුද්‍රණාලය,342/1 , බුලත්ගම | නිවාස හයක් සඳහා පානීය ජලය ලබාගැනීම | සෞඛ්‍ය | බලන්ගොඩ නගර සභාව | පානීය ජලය ලබාගැනීම |
| බීඑල්/විවිධ/ 41 | බළන්ගොඩ | බුලත්ගම | ඩබ්.ඩබ්.පද්මලතා මිය පොල්හේන,උඩකන්ද, බළන්ගොඩ | පොල්වත්ත වත්තට පැමිණෙන මාර්ගය පිළිසකර කරගැනීම | මාර්ග | බළන්ගොඩ නගර සභාව | මාර්ගය පිළිසකර කරගැනීම |

මේ සම්බන්ධව සාකච්ඡා කල සභාව , ජලය ලබාදීම ජල සම්පත් මණ්ඩලයට යොමු කිරීමටත් , මාර්ගය ඉදිකිරීම බළන්ගොඩ ප්‍රාදේශීය සභාව වෙත යොමුකිරීමටත් කටයුතු කරන බව දැන්වීමට සභාවේ අනුමැතිය ලබාදෙන ලදී.

## 05:45 වාරි මාර්ග හා ජල සම්පත් කළමනාකරණ අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක බහු ආංශිකව ජල සම්පත් සැලසුම් කිරීමේ ව්‍යාපෘතිය

උක්ත කරුණට අදාළව ප්‍රාදේශීය ලේකම් , බළන්ගොඩ විසින් එවා ඇති අංකඃඩීඑස්බී/පී/3/3/20 හා 2010.07.26 දිනැති ලිපිය සභාගත කරන ලදී.

වාරිමාර්ග හා ජල සම්පත් කළමනාකරණ අමාත්‍යාංශය විසින් ක්‍රියාත්මක කරනු ලබන ජල සම්පත් පරිහරණයට සහ සංරක්ෂණයට අවශ්‍ය සැලසුම් සකස් කිරීම සඳහා ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස මට්ටමින් අදහස් හා යෝජනා ලබාගැනීමේ මූලික අදියරේ ( ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ මට්ටමේ ) රැස්වීම 2010.08.03 වන දින ප.ව.1.00 ට ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී පැවැත්වෙන බව එමගින් දන්වා තිබිණ.

එම රැස්වීමට පහත සඳහන් රක්ෂිතයන් ආරක්ෂා කරදෙන ලෙස යෝජනාවක් ඉදිරිපත් කිරීමට සභාවේ අනුමැතිය ලබාදෙන ලදී.

i. තෙප්පකොළම අගුරු මුකලාන රක්ෂිතය
ii. දෙණියකුඹුර රක්ෂිතය
iii. බැංකියවත්ත උල්පත
iv. කරවිගහඇල්ල ජල රක්ෂිතය
v. කිරිඳිගල ලිඳ ( මිනි පෙට්ටි සාප්පුව අසල)
**vi.** පෙට්ටිගල ජල රක්ෂිතය

බැංකියවත්තට යන ස්ථානය අසල ඇති රක්ෂිතයේ වේවැල් පඳුරු විශාල සංඛ්‍යාවක් කපා ඇති බැවින් , මේ සම්බන්ධව පරීක්ෂා කර බලන ලෙස අඩවි වන නිලධාරී වෙත හා ප්‍රාදේශීය ලේකම් වෙත දන්වා යවන මෙන් ගරු නාගරික මන්ත්‍රී ඩබ්.ඒ.වසන්ත පුෂ්පකුමාර මැතිතුමා විසින් ඉල්ලීමක් කරන ලදී.

මේ සම්බන්ධව අදාල නිලධාරීන්ගේ අවධානය යොමුකරවීමට සභාව අනුමත කරන ලදී.

## 05:46 මේසයක් ලබාගැනීම

මෙම නගර සභාවට අලුතින් පැමිණි ජපන් ජාතික මිහාරා මහතා සිය නිවසේ පදිංචිව සිටින අතර ,ඔහුගේ පාවිච්චිය සඳහා සභාවෙන් ඉවත් කර ඇති මේසයක් ලබාදෙන ලෙසත් , එම මේසය අවශ්‍ය ඕනෑම අවස්ථාවක සභාවට ආපසු ලබාදීමට පියවර ගන්නා බවත් දන්වමින් , ගරු නාගරික මන්ත්‍රී ඩබ්.ඒ.වසන්ත පුෂ්පකුමාර ගුණරත්න මැතිතුමා විසින් එවා ඇති 2010.07.20 දිනැති ලිපිය සභාගත කරන ලදුව මේසයක් ලබාදීමට සභාවේ අනුමැතිය ලබාදෙන ලදී.

## 05:47 පුස්තකාල ස්වේච්ඡා පුහුණුව

බළන්ගොඩ නගර සභා මහජන පුස්තකාලයේ පුස්තකාල කටයුතු සම්බන්ධව ස්වේඡාවෙන් පුහුණුවීම සඳහා පහත සඳහන් අය විසින් ඉදිරිපත් කර ඇති අයදුම්පත් සභාගත කරන ලදුව මේ සඳහා සභාවේ අනුමැතිය ලබාදෙන ලදී.

01. එච්.ඒ.නිමාලී හෙට්ටිආරච්චි මෙනවිය,
නො.34, සේනක පෙදෙස,බලගහමුල,
බළන්ගොඩ.
02. ඩී.කේ.භාග්‍යා මාධවී දයානන්ද මෙනවිය,
" සඳකැළුම් "
වැගපිටිය,මොරහැල,බළන්ගොඩ.

03. කේ.ජී.ආලෝකා උමයාංගනා කහංගම මෙනවිය,
26/16, කරවිකැටිය පාර,
බළන්ගොඩ.

05:48 **පළාත් පාලන බල ප්‍රදේශයන්හි ජලාපවහනය විධිමත් කිරීම**

ඉහත සඳහන් කරුණට අදාලව පළාත් පාලන සහ පළාත් සභා අමාත්‍යාංශයේ ලේකම් විසින් එවා ඇති අංක පීඑල්/7/1/5/26 හා 2010.06.03 දිනැති ලිපිය ගරු සභාවේ අවධානය සඳහා ඉදිරිපත් කරන ලද.

ලංකාවේ බොහෝ නාගරික හා අර්ධ නාගරික ප්‍රදේශයන්හිම මෙන්ම ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයන්හි ද වර්තමානයේ පවත්නා අවිධිමත් ජලාපවහන ක්‍රමවේදයන් හේතුකොටගෙන වර්ෂා අවස්ථාවන්හි දී වැසි ජලය හා පිටාර ජලය එකතු වී ප්‍රබල මහජන පීඩා ඇති කරන බව අනාවරණය වී ඇති ඇත. ලංකාවේ පළාත් පාලන ආයතන පද්ධතිය මගින් පොදු ජල මාර්ග කුමන හෝ හේතුවක් නිසා අවහිර කිරීමට ඉඩ නොතැබිය යුතුය. අතර එබඳු ජල මාර්ග , කාණු ආදිය අවහිරවීමට තුඩු දී ඇති හේතු සාධක ක්ෂණිකව සොයා බලා ඒවා වැළැක්වීමට විධිමත් පියවර වහා ගන්නා ලෙසත් , විශේෂයෙන් මාර්ග හා පොදු ස්ථාන අසල බොහෝ පළාත් පාලන ආයතන තාවකාලිකව කසල එකතු කිරීම සිදුකරන බැවින් , එම ස්ථාන වලට මහජනයා විසින් ගෙනවිත් දමන කසළ බෑග් ,පොලිතීන් මලු සහ විවිධාකාර අපද්‍රව්‍ය රැගත් බදුන් වර්ෂාවත් සමග ගලි,කාණු,ඇල මාර්ග,බෝක්කු හා පාලම් ආදී ජලය බැසයාමට ඇති මාර්ග අවහිර කරන බව පෙනී ගොස් ඇති බැවින් එසේ අක්‍රමවත් ලෙස පවත්නා ස්ථාන වල කසළ තැන්පත් නොකිරීමටත් එකතුවන කසළ වහා අවසාන බැහැරලන ස්ථාන වෙත ගෙන යාමටත් පළාත් පාලන ආයතන වගබලා ගතයුතවන අතර , නගර සභා ආඥා පනතේ iv වන කොටසේ 103 වගන්තියේ සිට 128 දක්වා වූ විධිවිධාන කෙරෙහි විශේෂ අවධානය යොමු කරන ලෙසත් එමගින් අවධානය කර තිබුණි.

05:49 **කඩ කාමරවල මාසික කුළිය අඩුකරගැනීම**

බස්නැවතුම්පල කඩ කාමර වලින් මාසික කුළිය හා බිල ගෙවීමට තරම්වත් ප්‍රමාණවත් ආදායමක් නොලැබෙන බැවින් මාසික තක්සේරු මුදල පමණක් කුළිය වශයෙන් ගෙවීමට අවස්ථාව සලසාදෙන ලෙස ඉල්ලමින් බළන්ගොඩ බස්නැවතුම්පල කඩහිමියන් කිහිපදෙනෙකුගේ විසින් ඉදිරිපත් කර ඇති 2010.07.28 දිනැති ලිපිය සභාගත කරන ලදී.

පළාත් පාලන ගරු අමාත්‍යතතුමාගේ අනුමැතිය ලබාගෙන අදාළ ඉල්ලීම ඉටුකිරීමට සභාවේ අනුමැතිය ලබාදෙන ලදී.

05:50 **බළන්ගොඩ බස්නැවතුම්පල අංකඃ සී.13,14,15 කඩ කාමරවල කඩකුලී නොගෙවීම**

බස්නැවතුම්පල අංකඃ සී 13,14 හා 15 යන කඩ කාමර සඳහා කඩකුලී නොගෙවන බැවින් ඒ සදහා ගන්නා ක්‍රියා මාර්ගය සම්බන්ධයෙන් උපදෙස් පතා ලිපියක් ඉදිරිපත් කරතිබුණි.

සිදුව ඇති සිද්ධිය සම්බන්ධයෙන් සම්පූර්ණ වාර්තාවක් සකසා එයට අදාලව පළාත් පාලන කොමසාරිස්ගෙන් උපදෙස් ලබාගෙන ඒ අනුව කටයුතු කිරීමට තීරණය කරන ලදී.

05:51 **ආයුර්වේදයේ පුරප්පාඩුව ඇති කම්කරු තනතුර පිරවීමඃ**

බළන්ගොඩ නගර සභාවේ නිදහස් ආයුර්වේද බෙහෙත් ශාලාවේ සිටි ආයුර්වේද කම්කරු උසස්වීමක් ලැබ වෙනත් කාර්යාලයක සේවයට ගොස් ඇති බැවින් , එම පුරප්පාඩුව සඳහා සේවකයෙකු අත්‍යාවශ්‍ය බව යෝජනා විය.

මේ ගැන සලකා බැලූ සභාව සේවා අවශ්‍යතාව මත අයදුම්පත්‍ර කැඳවා , කොන්ත්‍රාත් පදනම මත සේවකයෙකු බඳවා ගැනීමට අනුමැතිය ලබාදෙන ලදී.

05:52 **කසළ ජනනය වන ස්ථානයේදීම වෙන්කිරීමේ ආදර්ශ ව්‍යාපෘතිය :**

ඉහත කරුණට අදාළව ඉදිරිපත් කර ඇති 2010.07.29 දිනැති ලිපිය සභාගත කරන ලදී.

JiCa වැඩ සටහන යටතේ කසළ ජනනය වන ස්ථානයේදීම වෙන්කර එකතු කිරීමේ වැඩ පිළිවෙළක් ක්‍රියාත්මක කිරීම සුදුසු වන අතර , එම ප්‍රදේශය දැනට ආදර්ශ ව්‍යාපෘතියක් ක්‍රියාක්මක කර මසකට පසු එහි ප්‍රගතිය මත අනෙකුත් ප්‍රදේශ වලට ක්‍රියාත්මක කිරීම සුදුසු බව එමගින් සඳහන් කර ඇත.

1. තෝරාගැනීමට යෝජිත ප්‍රදේශය : නගර සභාව අසල සිට කරව්කැටිය බෝම්බුව පාර සීමාව දක්වා.
2. මෙම නිවාස ආශ්‍රිතව 3 R සමාජ 20 ක් පිහිටුවීම.
3. කසළ වෙන්කිරීම සඳහා බෑග් හඳුන්වාදීම

ඉහත කරුණු කෙරෙහි අවධානය යොමුකල සභාව , මෙම ආදර්ශ ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමට සඳහා සභාවේ අනුමැතිය ලබාදෙන ලදී.

05:53 **කසළ බද්ද අයකිරීම විධිමත් කිරීම හා අලුත් ආයතන වලට කසළ බද්ද හඳුන්වාදීම**

මෙම නගර සභාව විසින් දැනට කසල බද්ද අයකිරීම සිදුකරන ලබන අතර , එය මාසිකව අයකිරීමේ ක්‍රමවේදයක් සකස් කිරීම අවශ්‍ය වන අතර , අය කරනු ලබන කසල බද්දෙන් 15% හෝ 20% ක ප්‍රමාණයක් එය එකතු කරනු ලබන අයට ගෙවීමටත් පහත සඳහන් ආයතන වෙත ද කසල බද්ද හඳුන්වාදීම සුදුසු බැව් දන්වමින් ඉදිරිපත් කර ඇති 2010.07.29 දිනැති ලිපිය සභාගත කරන ලදී.

| | | |
|---|---|---|
| i. | සියළුම සතුන් හා රූපලාවන්‍යාගාර සඳහා මාසිකව | රු.100/- |
| ii. | සිල්ලර කඩ මාසිකව | රු.150/- |
| iii. | තේ කඩ මාසිකව | රු.200/- |
| iv. | හාඩ්වෙයාර් මාසිකව | රු.150/- |
| v. | වී මෝල් මාසිකව | රු.300/- |
| vi. | පුද්ගලික පන්ති පවත්වන ස්ථාන | රු.250/- |

කසල බද්ද එකතු කිරීම සඳහා යොදවා ඇති අයට එකතු කරනු ලබන මුදලින් 20% ක කොමිස් මුදලක් ගෙවීමටත් , ඉහත ආයතන සඳහා ද කසල බද්ද පැනවීමට සභාවේ අනුමැතිය ලබාදෙන ලදී.

05:54 **වසා දැමූ රෙදිපිළි ව්‍යාපාරය සඳහා වරිපනම් ගෙවීම :**

ඉහත කරුණට අදාළව බළන්ගොඩ බාන්ස්රත්වත්ත මාවත අංකඃ 54/2 දරණ ලිපිනයේ පදිංචි ප්‍රියානි මුණසිංහ මහත්මිය විසින් ඉදිරිපත් කර ඇති ලිපියක් සභාගත කරන ලදී.

මැයට අයත් අංකඃ 54/1 දරණ නිවසේ වෙනම කාමරයක රෙදිපිළි ව්‍යාපාරයක් පවත්වාගෙන ගිය අතර , එම රෙදිපිළි කඩය සඳහා 54/ඒ වශයෙන් අංකයක් ලබාදී වරිපනම් අයකල අතර , දැනට එය වසා දමා අවුරුදු 1 1/2 ක පමණ කලක් ගතව ඇති බැවින් , එම ව්‍යාපාරය වෙනුවෙන් අයකරන ලද වරිපනම් බදු නිදහස් කරන මෙන් ඉල්ලා තිබිණ.

මෙම අංකය සඳහා වරිපනම් අයනොකිරීමට සභාවේ අනුමැතිය ලබාදෙන ලදී.

06. **මුදල් ගෙවීම් අනුමත කිරීම ( රු.10000/- ට වැඩි ගෙවීම්)**

2010.05.19 දින සිට 2010.06.14 දක්වා රු.10000/- ට වැඩි ගෙවීම් පිළිබඳ විස්තරයක් සභාවට ඉදිරිපත් කරන ලදී.

<table>
<tr><th>දිනය</th><th>විස්තරය</th><th>ව.අ.</th><th>චෙක්පත් අංකය</th><th>මුදල</th></tr>
<tr><td>2010.06.17</td><td>එම්ටි ඉන්ටර්නැෂනල් පුද්ගලික සමාගම<br>බළන්ගොඩ නගර සභා පුස්තකාලයට Time හා Fortune සඟරාව ලබාගැනීම සඳහා<br><br>Time සඟරාව අවුරුදු 01 9113.00<br>Fortune සඟරාව අවුරුදු 01 4375.00<br>13488.00<br>Vat 12% 1618.00<br>15106.00</td><td>73</td><td>189153</td><td>15106.00</td></tr>
<tr><td>2010.06.21</td><td>හේලීස් ඇග්‍රෝ ප්‍රොඩක්ට්ස් ලිමිටඩ්<br>සෞඛ්‍ය අංශය සඳහා සෝල්ෆැක්ස් ලීටර් 10 ලබාගැනීම</td><td>74</td><td>18954</td><td>81000.00</td></tr>
<tr><td>2010.06.22</td><td>තාවකාලික කම්කරු වැටුප්<br>කර්මාන්ත අංශයේ තාවකාලික කම්කරු වැටුප් ගෙවීම
<table>
<tr><th>විස්තරය</th><th>මුදල</th></tr>
<tr><td>පෙට්ටිගල පාර ශුද්ධ කිරීම</td><td>4500/-</td></tr>
<tr><td>ලේකම් නිල නිවස දොර ජනෙල් අලුත්වැඩියා කිරීම</td><td>750/-</td></tr>
<tr><td>බුලත්ගම පවර්හවුස් පාර ශුද්ධ කිරීම</td><td>500/-</td></tr>
<tr><td>තානායම අලුත්වැඩියා කිරීම</td><td>42750/-</td></tr>
<tr><td>තානායම්වත්ත ශුද්ධ කිරීම</td><td>8250/-</td></tr>
<tr><td>බුලත්ගම සුදර්ශනගම පර ශුද්ධ කිරීම</td><td>1500/-</td></tr>
<tr><td>මැද කිරිඳිගල පාර ශුද්ධ කිරීම</td><td>4000/-</td></tr>
<tr><td>විදුණැන පියස භූමියේ ඔසුපැළ සිටුවීම</td><td>2000/-</td></tr>
<tr><td>සමගිමාවත ආරම්භක ස්ථානයේ බැම්ම ඉදිකිරීම</td><td>3750/-</td></tr>
<tr><td>වැවේගෙදර පාර ශුද්ධ කිරීම</td><td>2500/-</td></tr>
<tr><td>කාර්යාලයේ තීන්ත ආලේප කිරීම</td><td>9000/-</td></tr>
</table></td><td>76-4</td><td>189156</td><td>79500.00</td></tr>
<tr><td>2010.06.23</td><td>පී.සී.සිස්ටම්ස්<br>කාර්යාල කටයුතු සඳහා අවශ්‍ය ප්‍රින්ටරයක් ලබාගැනීම
<table>
<tr><th>විස්තරය</th><th>මුදල</th></tr>
<tr><td>EPSON 2Q 2090</td><td>74500.00</td></tr>
<tr><td>Samsung Ml 1640 ( Laser )</td><td>14250.00</td></tr>
<tr><td></td><td>88750.00</td></tr>
</table></td><td>78</td><td>189163</td><td>88750.00</td></tr>
